# සැබෑ මිනිසකුගේ වින්දනීය ළමාවිය

එච්.එම්.එස්.එම්. ජයතිලක

"ඉදි අකුලට පැන්න කාලේ'' නම් කෘතිය ඔරුවල බන්දු නම් කතෘ විසින් රචනා කර ඇත. කැලණිය විශ්වවිද්‍යාලයේ නූතන භාෂා අධ්‍යයන අංශයේ සිටි ආචාර්‍යවරයෙක් ලෙස ඔරුවල බන්දු මහතා හඳුනාගත හැකිය. 1991 වර්ෂයේ රචිත මෙම ග්‍රන්ථයෙන් "විමල්" නැමැති තරුණ වියේ පසුවන පුද්ගලයෙකුගේ ජීවිත කතාවක් අළලා රචනා කර ඇත. ජීවිතයට එන විවිධ ගැටළුකාරී තත්වයන් හමුවේ නොසැලෙමින් ජීවිතය පිළිබඳ හොඳ අවබෝධයකින් යුතුව ජීවිතයට මුහුණ දෙන ආකාරය මෙහි මනාව ගෙනහැර දක්වා තිබේ. විමල් අධ්‍යාපනය අතින් ඉහළම ස්ථානය හිමි තරුණයෙකි. ඔහු ඉංග්‍රීසි, පාලි, සංස්කෘත, දෙමළ, ජෝතිෂ්‍ය වැනි විෂයන් පිළිබඳ අවබෝධයකින් සිටි අයෙකි. ඔහුගේ ජීවිතය සාහිත්‍යය, කවිවලින් පිරී තිබුණි. සමාජයට විශාල සේවාවක් සිදුකරනු ලබන විමල් අවසානයේදී රුසියාව බලා යනුයේ වැඩිදුර වැඩිදුර අධ්‍යාපනය සඳහාය. මෙවැනි චරිතයක් වටා ගෙතී ඇති ඉදි අකුලට පැන්න කාලේ නම් කෘතියෙහි විශ්‍රාන්තිමය කටයුතු ඇතුළත්ව ඇත්තේ මෙසේය.

විශ්‍රාන්තිය උදෙසා රචනය භාවිතා කර ඇති බව මෙසේ දක්වා ඇත. "ඔය මොනවාදෝ ලිය ලියා ඉරනවා, ඉරාදාපු කොළ කැළි මම උදේට ලිපට දානවා. කවි, ලිපි එහෙම ලියලා ඔය පත්තරවලටත් යවනව කියල ලොකු පුතා කිව්වේ. අද කවි ලියන්න ඕන වනමල්, රන්තරු, සමනල්ලු එහෙම නැත්නම් බොළඳ ප්‍රේමය ගැන නෙවෙයි...... ලබන පොසොන් පෝයට පෙරහැරක් කරමු."කුඩා අවධියේ සෑම ක්‍රියාවක්ම විශ්‍රාන්තියකි රචකයා මෙම විශ්‍රාන්තිය දකින්නේ මෙලෙසිනි. "අපි එකට සෙල්ලම් බත් ඉව්වා, කෝම් පිට්ටු හැදුවා එකට සිටිකාලේ ගියා. කොටුවලට වතුර දැම්මා, ගොයම් හිටෙව්වා "

එසේම විශ්‍රාන්තිය උදෙසා භක්තිය පාදක කර ගනිමින් තම මානසික නිදහස සොයා යන බව දක්වා ඇත්තේ මෙසේය. "කතරගමට පැමිණි මම මැණික් ගඟෙන් දිය නා සුදු සරම ඇඳ තමයි නටන නඩයට එක්වීමි." අතීත ගම්මානවල විනෝදාස්වාදය වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම්වල නියැලී ඇත. විවිධ ස්ථානවල තමන්ගේ මානසික නිදහස උදෙසා කතෘ විශ්‍රාන්තිමය ක්‍රියා මෙසේ දක්වා ඇත. "කලකට පෙර ඔහු පාසලේදී "සමුද්‍රදේවී" නාට්‍යයේ ප්‍රධාන නිළි චරිතය රඟ පෑ අයුරු තවම මතකය." ගමේ අවුරුදු උත්සවය කවි මඩු ආදිය සංවිධානය කර මෙහෙයවීමටද හැබෑ හපනෙකි." පන්සල් වත්ත පහළ නාන ළිං බැම්මේ වාඩි වී අපි තරඟයට හිටවන කවි කියමින් මහ රෑ වනතුරු විනෝදවීම ගැන........ තරුණ සමිතිය එදා ගත් තීරණය අනුව බිංගිරියේ කවි සමිඳුන්ගේ මුලාසනයෙන් කවි මඩුව ඇරඹිණි." අවට ගම්වල නිතර පැවැත්වෙන කවිමඩු, සල්පිල්, තොරණ වැනි ස්ථානවලද කවි කීමට මට ඇරයුම් ලැබේ."

සමාජයේ ඉහල තලයක වැජඹෙන පුද්ගලයකුගේ අතීතය හා වර්තමානය පිළිබඳව දක්වා ඇති මෙම කතෘ ඔහුගේ ජීවිතයේ විවිධ පැතිකඩයන් හරහා විවරණය කර ඇත. විශ්‍රාන්තිය කටයුතු කෙරෙහි ඔහුගේ ජීවිතය ගලාගිය ආකාරය මැනවින් දක්වා ඇත.

ඔරුවල බන්දු,(1991) ඉදි අකුලට පැන්න කාලේ.